**ශීර්ෂය 253 - විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව**

**---------------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**----------------**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

**-------------------------------**

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 ජූලි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජූනි 20 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---------------------------------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

**---------------------------------------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරිම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ

නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබූ බැවින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ සැසඳීමක් කළ නොහැකිය. තවද, මේ හේතුවෙන්ම ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ද මෙම වාර්තාවේ ඉදිරිපත් කර නැත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 වර්ෂය සඳහා ආදායම් ශීර්ෂ 20.04.01.00 යටතේ එකතු කරන ලද ආදායම රු.870,380 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | භාණ්ඩාගාර මුද්‍රිතවල ආදායම නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුවීම. | 2018 වර්ෂය සඳහා අවසන් භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශය 2019.02.12 දින නිකුත් කර තිබූ අතර අවසන් ගිණුම් සකස් කිරීමේදී 2019.02.05 දින භාණ්ඩාගාර ප්‍රකාශය පදනම් කර ගත් බැවින් මධ්‍යම රජය සඳහා දළ ආදායම රු. 870,380 කින් අඩු වී ඇත. |
| (ආ) | වෙනත් දෙපාර්තමේන්තු විසින් දෙපාර්තමේන්තුව වෙනුවෙන් දරන ලද වියදම රු.34,533,914,542 ක් වු නමුත් මූල්‍ය ප්‍රකාශනවලට අනුව එම වියදම රු.33,407,328,729 ක් ලෙස දක්වා තිබීමෙන් එකී වියදම රු.1,126,585,813 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | වෙනත් පාර්තමේන්තු හා අමාත්‍යාංශ විසින් දෙපාර්තමේන්තුව වෙනුවෙන් දරන ලද වියදම, ඇතුලත් කර නිවැරදිව වාර්ෂික වියදම ගිණුම්ගත කළ යුතුවීම. | පිළිගනිමි.<br>ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ප්‍රවර්ථන වර්ෂයට හා පූර්ව වර්ෂවලට අදාලව නොගෙවන ලද මුදල් විශ්‍රාම වැටුප්, දෙපාර්තමේන්තුව වෙත එවන නිසා වර්ෂයට අදාල නිවැරදි වටිනාකම සොයා ගැනිමට අපහසු වී ඇත. මේ පිළිබඳව භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ ද උපදෙස් ලබා ගෙන 2019 වර්ෂයේ සිට නිවැරදි කිරීමට පියවර ගෙන ඇත. |

### 1.6.2 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දේපල පිරියත හා උපකරණ රු.494,744 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි වටිනාකමට ගිණුම් ගත කළ යුතු වීම. | පිළිගනිමි.<br>2017 වර්ෂයේදී පුනරාවර්තන වියදම් යටතට ඇතුළත් කර තිබූ රු.494,197.00 ක වත්කම් මිලදී ගැනීම ස්ථාවර වත්කම් ලේඛණයට ඇතුළත් කර ඇතත් 2018 මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයෙහි ඇතුළත්ව |

නොතිබුණි.

**1.6.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳව වූ සැසඳුම් ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| විගණනයට ඉදිරිපත් කල රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුමේ සැසඳුම් ප්‍රකාශය අනුව 2018 දෙසැම්බර් 31 දිනට වැඩ තහනම් කර ඇති, සේවය අතහැර ගොස් ඇති හා මාරු වී ගිය නිලධාරින්ගෙන් අයවිය යුතුව තිබුණු හිඟ ණය ශේෂ වල එකතුව රු. 3,290,000 ක් විය. එම හිඟ ණය ශේෂ අතරින් වර්ෂ 5ට වැඩි කාලයක සිට නිලධාරින් 14 දෙනෙකුගෙන් අයකර ගත යුතු හිඟ ණය ශේෂය රු. 564,841 ක් විය. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | නිලධාරින්ගේ වර්තමාන සේවා ස්ථාන පිළිබඳ තොරතුරු නොමැතිවීම, නිලධාරියා දැනුවත් කිරීමට ප්‍රමාණවත් තොරතුරු නොමැතිවීම, ණය ශේෂය පියවන ලෙස දන්වා යැවූ ලිපි ආපසු ලැබීම වැනි හේතු නිසා ණය ශේෂ අය කර ගැනීමට ප්‍රමාද වී ඇති අතර ශේෂ කිහිපයක් සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට නීතිපතිට යොමු කර ඇත. |

**1.6.4 විගණනය සඳහා සාක්ෂි නොවීම.**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ආදායමෙන් ආපසු ගෙවීම් වටිනාකම රු. 588,412 ක් සඳහා හර නිවේදන නිකුත් කළ බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය. | චක්‍රලේඛ ප්‍රකාරව හර නිවේදන ගෙන්වා ගත යුතුවීම. | ආදායමින් ආපසු ගෙවීම නිර්දේශ කර යවන අවස්ථාවේ දී හර නිවේදන එවීම පිළිබඳව ලිඛිතව දැනුවත් කිරීම් කරන අතර ආදායමින් ආපසු ගෙවීම නිර්දේශ කිරීමේ දී හර කිරීමට අදාල සියලු තොරතුරු ද එහි ඇතුලත් වන බැවින් නැවත සිහි කැඳවීමක් නොකෙරේ. |

**1.6.5 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| නිරීක්ෂණය | නිර්දේශය | දෙපාර්තමේන්තුව අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) දෙපාර්තමේන්තුව මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතුය. එම | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම | විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලිය පිළිබඳව සමාලෝචනයන් සිදුකර අභ්‍යන්තර පරිපාලන ක්‍රමවේදයන්හි අත්‍යවශ්‍ය වෙනස්වීම් සිදුකර ඇතත් එම |

| | | | |
|---|---|---|---|
| | පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු විය. එහෙත් එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | | තොරතුරු ලිඛිතව දන්වා නොමැති බව පිළිගනිමි. |
| (ආ) | විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, 2018 වර්ෂය සඳහා විමසුම් 8 ක් ඉදිරිපත් කර 2019 සැප්තැම්බර් 30 දිනට මාස 03 සිට මාස 11 දක්වා කාලයක් ගතවී තිබුණද පිළිතුරු ලබා දී නොතිබුණි. | - එම - | දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව හා සම්බන්ධිත අනෙකුත් රාජ්‍ය ආයතනයන්ගෙන් ද පිළිතුරු හා පැහැදිලි කිරීම් ලබාගෙන විගණන විමසුම් සඳහා පිළිතුරු ලබා දිය යුතු බැවින් කාල පමාවක් පවතින බව පිළිගනිමි. |

### 1.6.6 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 170 (2) (අ), (ආ), (ඇ), (ඈ), (ඉ)** | 2018 විශ්‍රාමික දිනය වෙනුවෙන් පැවැත්වෙන උත්සවය සඳහා පෞද්ගලික ආයතන 15 කින් දෙපාර්තමේන්තුව වෙත ලැබී තිබූ මුදල් රු. 5,991,000 ක් 2019 ජුලි 08 වනවිටත් පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි. | බාහිර ආයතනවලින් ලැබෙන ප්‍රදාන සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතු වීම. | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව සමඟ අත්වැල් බැඳ සිටින පෞද්ගලික අංශයේ ආයතන විසින් ලබා දී තිබූ මුදල් අනුග්‍රහයන් මඟින් ජාතික උත්සව 9 ක් සඳහා රු.2,365,000 ක මුදලක් ලබාගත් අතර ඉතිරි මුදල් දෙපාර්තමේන්තුවේ අරමුණු ඉටු කර ගැනීම සඳහා යොදවා ගැනීමට නියමිතය. |

| | | | |
|---|---|---|---|
| (ආ) විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛ | | | |
| (i) 2014 අප්‍රේල් 07 දිනැති අංක 01/2011 (සංශෝධන) දරන චක්‍රලේඛය | සෑම ප්‍රාදේශිය ලේකම් කාර්යාලයක් විසින්ම විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලිය විධිමත් කිරිම සඳහා ක්‍රමවත් පාලන ගිණුමක් පවත්වාගෙන යායුතු වුවත් නියැදි පරික්ෂණයකට අනුව ප්‍රාදේශිය ලේකම් කාර්යාල 5ක් විසින් එබඳු පාලන ගිණුම් පවත්වාගෙන ගොස් නොතිබුණි. | ක්‍රමවත් පාලන ගිණුමක් සෑම ප්‍රාදේශිය ලේකම් කාර්යාලයක්ම සකස් කර විශ්‍රාම වැටුප් වියදමේ නිවැරදිතාවය තහවුරු කළ යුතුවීම. | සියළු විශ්‍රාම වැටුප් ගෙවීම් හා සංශෝධන ක්‍රියාවලිය මධ්‍යගත දත්ත පද්ධතියෙන් සිදු කරන බැවින් වෙනම පාලන ගිණුමක් පවත්වා ගෙන යෑමට අපහසුතාවයක් නොමැත. එම වෙනස්වීම් හදුනාගෙන පාලන ගිණුම සැකසීම ප්‍රාදේශීය ලේකම්ගේ වගකීමකි. |
| (ii)2013 දෙසැම්බර් 03 දිනැති අංක 06/2013 දරන චක්‍රලේඛය | නොගෙවූ විශ්‍රාම වැටුප් නියමිත මාසයට පසු මාසයේදී විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත එවිය යුතු වුවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක එකතුව රු. 4,567,674 ක් වූ මුදල් පොදු තැන්පත් ගිණුම්වල මාස 02 සිට මාස 12 දක්වා කාලයක් රඳවා තබා ගැනීමෙන් පසු ආපසු එවා තිබුණි. | නොගෙවූ විශ්‍රාම වැටුප්, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත කඩිනමින් ගෙන්වා ගැනීමට හා අධීක්ෂණය කිරීමට වැඩ පිළිවෙලක් සකස් කළ යුතු විම. | නොගෙවූ විශ්‍රාම වැටුප් පොදු තැන්පත් ගිණුමේ රඳවා තබා නොගෙන විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත එවන ලෙස උපදෙස් ලබා දී ඇතත්, එම උපදෙස්වලට පටහැනිව කාර්යාල වියදම් සඳහා එම මුදල් භාවිතා කිරීමේ ප්‍රවනතාවයක් පවතී. |
| (iii) 2016 අප්‍රේල් 27 දිනැති අංක 3/2016 දරන චක්‍රලේඛය හා 2015 පෙබරවාරි 11 දිනැති අංක 5/2015 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | රු. 3,500 ක්වූ මාසික අන්තර් දීමනාව 2016 ජනවාරි 01 දිනෙන් පසු විශ්‍රාම ගන්නා ලද විශ්‍රාමිකයන්ට හිමිනොවන නමුත් නියැදි පරික්ෂාවකදී හෙළිදරව් කරගත් පරිදි ඊට පටහැනිව වරකාපොල ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ විශ්‍රාමික නිලධාරීන් තුන් දෙනෙකුට උක්ත අන්තර් දීමනාව ලෙස රු. 261,991 ක් ගෙවා තිබුණි. | මුදල් රෙගුලාසි 103 හා 104 ප්‍රකාරව කටයුතු කිරීම. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. |
| (iv) 2018 ජූලි 17 දිනැති අංක 9/2008 (සංශෝධන II) දරන | සේවා කාලය සම්පූර්ණ නොවූ විශ්‍රාමිකයින් සඳහා ගෙවනු ලබන දුබලතා විශ්‍රාම වැටුප ගෙවීම නතර කර 59 කාණ්ඩය යටතේ ගෙවනු ලබන මූලික වැටුප සමඟ | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | 59 කේතය යටතේ සේවා කාලය අවු.10/12 ට අඩු ක්‍රියාන්විතයේදී ආබාධිත තත්ත්වයට පත් හමුදා නිලධාරින් හට සේවා විශ්‍රාම වැටුප ආරම්භ කිරිමේදී, කේත අංක 6/42 යටතේ දුබලතා විශ්‍රාම වැටුප |

| | | | |
|---|---|---|---|
| චක්‍රලේඛය | දුබලතා විශ්‍රාම වැටුප දත්ත පද්ධතිය තුල එක්කර දැක්විය යුතුවිය. එහෙත් වරකාපොළ සහ අලව්ව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල එසේ විශ්‍රාම වැටුප් ඒකාබද්ධ කර නොතිබූ බව නිරීක්ෂණය විය. | | පිරිනමා ඇති සහ නොමැති අය ජාතික හැඳුනුම්පත් අංකයෙන් හෝ බැංකු ගිණුම් අංකයෙන් හඳුනාගත නොහැකි තත්ත්වයක් පවතී. එවැනි අවස්ථා හඳුනා ගැනීමට කටයුතු කරමින් පවතී.<br>59 කේතය යටතේ ගෙවනු ලබන සේවා විශ්‍රාම වැටුපට කිසිදු දීමනාවක් නොගෙවන අතර, එය විශ්‍රාමිකයාගේ වයස අවු. 55 සම්පූර්ණ වූ විට කේත අංක 69 බවට පත්වේ. |
| **(ඇ) අංක 1719/3 හා 2011 අගෝස්තු 15 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය.** | උපතින් පූර්ණ ආබාධිත නොවන තැනැත්තන් වසර 05 කට වරක් වෛද්‍ය මණ්ඩලයට යොමු කල යුතු වුවත් නියැදි පරීක්ෂාවලදී හෙළි දරව් වූ පරිදි ප්‍රාදේශීය ලේකම් කාර්යාල 5 ක එබඳු තැනැත්තන් කිසිම අවස්ථාවක වෛද්‍ය මණ්ඩලවලට යොමුකර නොතිබුණි. | වසර 05 කට වරක් වෛද්‍ය මණ්ඩලයට යොමු කර ආබාධිත බව තහවුරු කර ගෙන ගෙවීමට කටයුතු කළ යුතුවීම. | ආබාධිත විශ්‍රාම වැටුප් ලබන උපතින් පූර්ණ ආබාධිත නොවන විශ්‍රාමිකයින් පිළිබඳව අබා 03 ආකෘතියෙන් ග්‍රාම නිලධාරි මඟින් තොරතුරු ලබාගෙන වෛද්‍ය මණ්ඩලය වෙත යොමු කිරිමට අවශ්‍ය කටයුතු සිදුකිරිමට සටහන් කර ගත් බව ප්‍රාදේශීය ලේකම්වරු විසින් දන්වා ඇත. |

**1.6.7 වංචනික ස්වරූපයේ ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සිවිල් හා වැන්දඹු ලෙස විශ්‍රාම වැටුප් 02 ක් ලබමින් සිට මිය ගිය විශ්‍රාමික නිලධාරිනියකට මිය ගොස් මාස 55 ක් දක්වා මිය යන විට ලබමින් සිටි විශ්‍රාම වැටුප බැංකු ගිණුමට බැර කර තිබුණි. එසේ බැර කරන ලද මුදලින් රු. 2,696,303 ක් ATM කාඩ්පත භාවිතා කර මියගිය අයගේ පුතා විසින් ලබාගෙන තිබුණි. මෙයින් රු. 308,052 ක මුදලක් ඔහු විසින් පසුව දෙපාර්තමේන්තුවට ගෙවා ඇතත් ඉතිරි රු. 2,388,251 ක මුදල 2019 ජුනි 30 වන විටත් අයකර ගෙන නොතිබුණි. | මුදල් රෙගුලාසි 101 සිට 112 පරිදි හා අදාළ විශ්‍රාම වැටුප් චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කර වංචනිකව ලබා ගත් මුදල් ආපසු අයකර ගැනීමට අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගත යුතුවීම. | මෙම මරණය කාර්යාලය වෙත වාර්තා නොවීම හේතුවෙන් මෙම වැඩිපුර ගෙවීම සිදුවී ඇත. විශ්‍රාමික පදිංචි සහතික කැඳවීම මඟින් මෙම මරණය අනාවරණය කරගත් අතර, වැඩිපුර ගෙවා තිබූ රු.2,696,303 ක් වංචාව කල පුද්ගලයා විසින් රු.308,052 ක් ගෙවා ඇත. අදාළ ප්‍රාදේශීය ලේකම් හා දිස්ත්‍රික් ලේකම් විසින් මු.රෙ 104(1)ආ අනුව පරීක්ෂණ කටයුතු ද, අදාල පුද්ගලයාට එරෙහිව නීතිමය පියවර ද ගෙන ඇති බව දන්වා තිබේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2013 නොවැම්බර් 07 දින මියගිය නිලධාරිණියක මිය යන අවස්ථාවේ ලබමින් සිටි විශ්‍රාම වැටුප මිය ගොස් මාස 29 ක කාලයක් සඳහා රු.582,423 ක් විශ්‍රාමිකයාගේ බැංකු ගිණුමට බැර කර තිබුණි. වරින් වර **ATM** කාඩ්පතක් භාවිතා කරමින් මෙම ගිණුමේ මුදල් ලබාගෙන තිබූ අතර 2019 ජුනි 30 වන විටත් ඉවත් කර ගෙන තිබූ රු. 581,**916** ක් අදාල පාර්ශවයන්ගෙන් අයකරගෙන නොතිබුණි. | අදාල විශ්‍රාම වැටුප් චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කර වංචනිකව ලබා ගත් මුදල් ආපසු අයකර ගැනීමට අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගත යුතුවීම. | මෙම වැඩිපුර ගෙවීම වංචනිකව ලබාගෙන ඇති බව 2016 වර්ෂයේ පදිංචි සහතික කැඳවීම මගින් අනාවරණය කරගැනීමට හැකිවිය.<br>මෙම වංචාව සිදුකල පුද්ගලයා කවුරුන්ද යන්න මේ වන තෙක් අනාවරණය කර ගැනීමට හැකි වී නොමැත. බැංකුව මගින් අදාළ A.T.M කැමරා දර්ශන. ලබා නොදීම හේතුවෙන් මෙම වංචාව සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කිරීමට ප්‍රමාද වී ඇති අතර ඉදිරියේ දී මේ සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට තීරණය කර ඇති බව ප්‍රාදේශීය ලේකම් විසින් දන්වා ඇත. |
| (ඇ) | ප්‍රාදේශිය ලේකම් කාර්යාල 2 ක් මගින් තාවකාලික හා ස්ථිර වශයෙන් විශ්‍රාම වැටුප් දෙකක් 1991 ජනවාරි සිට 2016 පෙබරවාරි දක්වා වසර 20 ක කාලයක් නිලධාරියෙකු විසින් ලබා ගෙන තිබුණි.<br>මෙලෙස එක් ප්‍රාදේශිය ලේකම් කාර්යාලයක් මගින් වැඩිපුර ලබාගත් මුදල රු. 1,872,387 ක් වී තිබුණු අතර 2016 පෙබරවාරි 10 සිට විශ්‍රාම වැටුප් ගෙවීම නවතා තිබූ නමුත් වැඩිපුර ගෙවා තිබූ මුදල් අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි. | අදාල විශ්‍රාම වැටුප් චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කර වංචනිකව ලබා ගත් මුදල් ආපසු අයකර ගැනීමට අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගත යුතුවීම. | මෙම විශ්‍රාම වැටුප් වංචාව සම්බන්ධයෙන් ගම්පහ ජ්‍යොෂ්ඨ පොලිස් අධිකාරි කාර්යාලය යටතේ කරන ලද පැමිණිල්ල අනුව නඩුව විභාග වෙමින් පවතී. කෙසේ වුවද මෙම විශ්‍රාමිකයාගේ නීත්‍යානුකුල විශ්‍රාම වැටුප ගෙවීම මහර ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මගින් නතර කර ඇත. |
| (ඈ) | විශ්‍රාම වැටුප් දත්ත පද්ධතියෙහි විශ්‍රාමිකයාගේ ජාතික හැඳුනුම්පත් අංකය වෙනුවට දියණියගේ ජාතික හැඳුනුම්පත් අංකය යොදා විශ්‍රාමිකයා මිය ගොස් මාස 86 ක කාලයක් ගතවන තෙක් මියගිය මවගේ විශ්‍රාම වැටුප ලෙස රු. 1,562,470 ක් දියණියක් විසින් සාවද්‍ය ලෙස ලබාගෙන තිබුණි. මෙම වැඩිපුර ගෙවූ මුදල් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාල විශ්‍රාම වැටුප් චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කර වංචනිකව ලබා ගත් මුදල් ආපසු අයකර ගැනීමට හා වගකිව යුතු නිලධාරීන් නිශ්චය කර අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගත යුතු වීම. | විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් විසින් දිස්ත්‍රික් ලේකම් අමතා මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව පරීක්ෂණ සිදු කර වාර්තාව ඉදිරිපත් කරන ලෙසත් නීතිමය පියවර ගන්නා ලෙසත් දැනුම් දී ඇති ලිපියක් ලබා දී ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාජ සංරක්ෂණ දායක මුදල් - (පළාත් සභා) හා හිඟ මුදල් දායකයන් අනුව නිශ්චිතව හඳුනාගත හැකි වන පරිදි සුදුසු දත්ත පද්ධතියක් සකස් කර නොතිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුලදී මෙම ශීර්ෂය සඳහා රැස් කරන ලද රු.මිලියන 8,683 ක් වූ ආදායම වර්ෂය සඳහා වූ ආදායම් ලැබීම්, හිඟ ආදායම් ලැබීම් ලෙස වෙන්කර හඳුනා ගැනීමටත් දායකයා අනුව වෙන්කර ගැනීමටත් නොහැකි වි තිබුණි. | දායකයින් හා දායක ගෙවීම් පිළිබඳ දත්ත පද්ධතියක් පවත්වා ගත යුතුවීම. | සියළු රාජ්‍ය ආයතනවල නිලධාරීන්ගේ මාසික වැන්දඹු අනත්දරු දායක මුදල් අයවීම් වාර්තාවෙන් වෙන්ව පවත්වා ගෙන යාම ප්‍රායෝගිකව සංකීර්ණ ක්‍රියාවලියක් වේ. |
| (ආ) | වැන්දඹු අනත්දරු දායක ගෙවීම් සඳහා වූ චෙක්පත් ඊලග මාසයේ 5 වන දිනට පෙර ගෙන්වා ගත යුතු වුවත් එම චෙක්පත් ගෙන්වා ගැනීමේදී දින 70 සිට දින 184 දක්වා ප්‍රමාදයන් නිරීක්ෂණය විය. පළාත් සභා විසින් සියළුම කාර්යාලවල දායක මුදල් වෙනුවෙන් එක් චෙක්පතක් නිකුත් කරන්නේ නම් සෑම මසකම අයකිරීම් ඊළඟ මාසයේ 15 වැනි දිනට පෙර ගෙන්වා ගැනීමට කටයුතු කල යුතු වුවත් එම මුදල් දින 10 සිට දින 54 දක්වා ප්‍රමාදයන් දක්නට ලැබුණි. | නියමිත දිනට දායක මුදල් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුවීම. | ඊළඟ මාසයේ 20 වන දින දක්වා කල් ලබාදීමක් සිදු කර ඇති අතර ප්‍රමාද වන සෑම අවස්ථාවකම දුරකථන මාර්ගයෙන් සහ ලිපි මඟින් අදාල මුදල් ගෙන්වා ගැනීමට කටයුතු කර ඇත. එසේම මෙම මුදල් නිසි පරිදි දෙපාර්තමේන්තුවට එවීම ද අනෙකුත් සියලු රාජ්‍ය ආයතනයන්හි වගකීම වේ. |
| (ඇ) | චෙක්පත් මඟින් දායක මුදල් එවනු ලබන ආයතන 03 ක් විසින් ඉදිරිපත් කරන ලද රු. 573,809 වටිනා චෙක්පත් 06 ක් විවිධ හේතු මත 2018 වර්ෂයේදී ආපසු හරවා යවා තිබූ නමුත් 2019 මැයි 06 වන විට වසරකට වැඩි කාලයක් ගත වී | හරවා යවන ලද චෙක්පත් නොපමාව ගෙන්වාගත යුතු වීම. | පිළිගනිමි. එම චෙක්පත් සම්බන්ධව දිගින් දිගටම අදාල ආයතන වෙතින් විමසීම් කල ද මේ වන තෙක් පිළිතුරු ලැබී නොමැත. |

තිබුණත් එම දායක මුදල් නැවත අයකරගෙන නොතිබුණි.

## 2.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය සඳහා පුනරාවර්තන වැය විෂයයන් 04 කට සහ මූලධන වැය විෂයයන් 02 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනය පිළිවෙලින් රු.මිලියන 1,202.13 ක් හා රු.මිලියන 1.21 ක් වූ අතර එම වැය විෂයයන්ට අදාල මුළු වියදම පිළිවෙලින් රු. මිලියන 156.99 ක් හා රු.මිලියන **0.**88 ක් විය. ඒ අනුව වැය විෂයයන්ට අදාලව ඉතිරිවීම් පිළිවෙලින් රු.මිලියන 1,045.13 ක් හා රු.මිලියන **0**.32 ක් විය. මෙයින් එක් වැය විෂයක ඉතිරිය සියයට 100 ක් හා වටිනාකම රු.මිලියන 1,000 ක් වු අතර ඉතිරි වැය විෂයන් 05 ක ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 17.5 සිට සියයට 28.5 දක්වා පරාසයක පැවතුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදි වියදම් ඇස්තමේන්තු පිළියෙල කල යුතුවීම. | පිළිතුරු ලබා දී නොමැත. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 06 ක් සඳහා වෙන් කරගන්නා ලද රු.මිලියන 138,117 ක ප්‍රතිපාදනයන්ට අමතරව මු.රෙ 66 හා 69 යටතේ ශුද්ධ මාරු කිරීම් රු. මිලියන 374.73 ක් අඩුකල පසුද රු.මිලියන 1,299.19ක් ඉතිරිව පැවතුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදි වියදම් ඇස්තමේන්තු පිළියෙල කල යුතු වීම. | වැය විෂයයන් වල 5% කට වඩා වැඩි ප්‍රතිශතයක ඉතිරිවීම් සඳහා අමතර වියදම් නොකිරීම වැනි හේතුන් බලපා තිබුනි. |

**2.3 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මුදල් රෙගුලාසි 371(2)(ඇ) ප්‍රකාරව අත්තිකාරම අදාල කාර්යය අවසන් කල වහාම පිය විය යුතු වුවද, රු. 50,000 ක්වූ අත්තිකාරම් 4 ක් පියවීමට අත්තිකාරම් ලබාගත් දින සිට දින 42 සිට 114 දක්වා කාල පරාසයක් ගත කර තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | වියදම්වල ස්වභාවය හා බිල්පත් එකතුකර ගැනීමේ ප්‍රමාදය නිසා අත්තිකාරම් පියවීම ප්‍රමාද වී ඇත. |

**2.4 තැන්පත් ශේෂයන්**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ක්ෂේත්‍රගත නිලධාරින් 05 දෙනෙකු වෙනත් සේවයකට යාම නිසා එම නිලධාරීන්ට ලබාදුන් යතුරු පැදි සඳහා අයකර ගන්නා ලද රු. 696,500 ක මුදල් ජාතික අයවැය දෙපාර්තමේන්තුවට යැවීමකින් තොරව 2018 ඔක්තෝබර් සිට පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. | මෙම මුදල් ජාතික අයවැය දෙපාර්තමේන්තුවට යැවීමට කටයුතු කළ යුතුවීම. | එම නිලධාරීන්ගේ යතුරුපැදි කල්බදු ලේඛණයෙන් ඉවත් කිරිම සඳහා චක්‍රලේඛ ප්‍රකාරව තොරතුරු සමඟ ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත යැවිය යුතුවේ. එම නිලධාරින්ගෙන් තොරතුරු ඉල්ලා ඇතත් මේ වන තෙක් ලැබී නොමැති නිසා පොදු තැන්පතු ගිණුමේ රඳවා ගන්නා ලදී. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 ප්‍රසම්පාදනයන්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ අංශ 6 ක නවීකරණ කටයුතු කිරීම සඳහා පෞද්ගලික කොන්ත්‍රාත්කරුවකුට භාර දී තිබුණි. කොන්ත්‍රාත්කරු වෙත | ගිවිසුම මඟින් එකඟ වූ ආකාරයට කටයුතු සම්පූර්ණ කරන බවට තහවුරු කර ගත යුතු වීම හා නිවැරදි මිනුම් මත | පිළිගත නොහැක. කාර්මික නිලධාරි සහතිකය මත ගෙවීම් කර ඇති අතර 2018.12.31 දිනට පෙර දෙපාර්තමේන්තු අවශ්‍යතා මත අත්‍යාවශ්‍ය |

| | | | |
|---|---|---|---|
| | ගෙවීම් කිරීමේදී එකඟ වූ ගිවිසුමේ සඳහන් ප්‍රමිතීන් අනුව සම්පූර්ණ කර නොතිබූ කාර්යයන් වෙනුවෙන් රු.332,151ක්ද, සම්පූර්ණයෙන්ම ඉටු නොකළ කාර්යයන් වෙනුවෙන් රු.1,132,748 ක්ද වශයෙන් වැඩිපුර ගෙවා ඇති බව නිරීක්ෂණය විය. | ගෙවීම් කිරීම කළ යුතු වීම. | සංශෝධන කිරීම් සිදු කර ඇත. විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් සුදුසුකම්ලත් හා පිළිගත් තාක්ෂණික නිලධාරියෙකු යොදවා ලබාදෙන මතයන් පිළිගන්නා අතර යම් වැඩියෙන් ගෙවීමක් සිදුව ඇත්නම් නැවත තාක්ෂණික ඇගයීමක් සිදුකර රඳවා ගෙන ඇති මුදලින් අය කරනු ලැබේ. |
| (ආ) | දෙපාර්තමේන්තුවේ තොරතුරු තාක්ෂණ අංශය නවීකරණය කිරීම සඳහා බිල්පත් පියවීමේදී ගණනය කිරීමේ දෝෂයක් හේතුවෙන් රු.122,939 ක් වැඩිපුර ගෙවා තිබුණි. | ගණනය කිරීම්වල නිවැරදිතාවය තහවුරු කර ගත යුතු වීම හා අලාභය වගකිව යුත්තන් ගෙන් අයකර ගත යුතු වීම. | එම ගෙවීම ගණනය කිරීමේ දෝෂයකි. සැපයුම්කරුගේ රඳවා ගැනීමේ මුදල් නැවත ගෙවීමේදී අය කර ගැනීමට කටයුතු කරනු ලැබේ. |
| (ඇ) | රජයේ විගණන අංශය, අභ්‍යන්තර විගණන අංශය සහ විෂමතා හා දායක මුදල් අංශ සඳහා වායුසමීකරණ යන්ත්‍ර මිලදී ගැනීම සහ සවි කිරීමේදී ගිවිසුම පරිදි ඉටු නොකළ කාර්යයන් සඳහා රු.114,954 ක් වැඩිපුර ගෙවා තිබුණි. | අලාභයක් සිදු වී ඇතිනම් නැවත අයකර ගත යුතු වීම. | නියමිත ප්‍රමාණයට වඩා ගෙවීමක් කර ඇත්නම් නැවත අය කිරීමට කටයුතු කරමි. |

**3.2 පාඩු හා හානි**

---------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශනවලට අනුව සමාලෝචිත වර්ෂය අවසාන වන විට තවදුරටත් අයකර ගත යුතු වැඩිපුර ගෙවන ලද විශ්‍රාම වැටුප් ශේෂය රු.මිලියන 591 ක් වී තිබුණි. මෙම ශේෂය, වර්ෂ 10 කට වඩා වැඩි කාලයක සිට පැවත එන රු. මිලියන 8 කින්ද වර්ෂ 5 සිට වර්ෂ 10 ක් දක්වා කාල පරාසයක සිට පැවත එන රු. මිලියන 37 කින්ද හා වර්ෂ 5 ක අඩු කාලයකට අයත් රු. මිලියන 546 කින් ද සමන්විත විය. | විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවීම් අප්‍රමාදව අයකර ගැනීම සඳහා පද්ධති හා පාලන ක්‍රම හඳුන්වා දිය යුතු වීම. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. |
| (ආ) | හානි හා පාඩු ලේඛනයේ සඳහන් 2017 දෙසැම්බර් 31 අවසන් ශේෂය හා 2018 ජනවාරි 01 ආරම්භක ශේෂ සැසඳීමේදී ප්‍රාදේශීය ලේකම් | පසුගිය වර්ෂයේ අවසාන ශේෂය සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය ලෙස | ප්‍රාදේශිය ලේකම් කාර්යාල විසින් එවනු ලබන කාර්තු වාර්තාවල ඇතැම් අවස්ථාවලදී 2017 දෙසැම්බර් 31 දිනට ශේෂයන් හා |

| | | |
|---|---|---|
| කාර්යාල 444 ක නොසැසඳීම් නිරීක්ෂණය විය. | ගත යුතු වීම. | 2018 ජනවාරි 01 දිනට ශේෂයන් නොසැසඳෙන අවස්ථාවන් දක්නට ලැබුණි. මේ පිළිබඳව විමසීම් කර වෙනස්කම් හඳුනාගෙන ගැලපීම් සිදු කර 2018 වර්ෂය අවසානයේදී හානි හා පාඩු ලේඛණය පිළියෙල කර ඇත. එබැවින් ඉහත වෙනස්කම් දක්නට ලැබුණි. |

## 3.3 කළමනාකරණ ක්‍රියාකාරකම්

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | නියැදි පරීක්ෂාවකදී අණාවරනය කරගත් පරිදි රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/2006 ට අනුව විශ්‍රාම වැටුප් සංශෝධනය නොකල, ප්‍රාදේශිය ලේකම් කාර්යාල 06 ක ලිපිගොනු සංඛ්‍යාව 669 ක් විය. | චක්‍රලේඛය විධි විධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | සංශෝධනයන් හා විෂමතා ඉවත් කිරිම සඳහා අවශ්‍ය තොරතුරු ලද පසු එම සංශෝධනයන් ඉවත් කිරීමට කටයුතු කරන බව ප්‍රාදේශීය ලේකම්වරු විසින් දන්වා ඇත. |
| (ආ) | ගම්පහ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ විශ්‍රාම ලිපිගොනු තැන්පත් කිරිම සඳහා අළුතින් සකස් කර තිබූ ලේඛනාගාරය 2018 දෙසැම්බර් 31 වන විටත් නිෂ්කාර්යව පැවතුණු අතර කාර්යාලයට අයත් ලිපිගොනු 11,000 ක් පමණ ප්‍රමාණයක්, ප්‍රමාණවත් ආරක්ෂාවක් නොමැතිව අවිධිමත්ව පැරණි ලේඛනාගාරයේ තැන්පත් කර තිබුණි. | වත්කම් කාර්යක්ෂම ලෙස පරිහරනය කල යුතු වීම . | නව ලේඛනාගාරයේ ගොනු තැන්පත් කිරීම අවසන් අදියරේ පවතින බව ප්‍රාදේශීය ලේකම් විසින් දන්වා ඇත. |
| (ඇ) | නියැදි පරීක්ෂාවකදී හෙළිදරව් කරගත් පරිදි ප්‍රාදේශිය ලේකම් කාර්යාල 6 ක ලිපිගොනු නොමැතිව විශ්‍රාමිකයින් 512 කට විශ්‍රාම වැටුප් ගෙවමින් පැවතුණි. | විශ්‍රාම වැටුප් ගෙවන සෑම විශ්‍රාමිකයකුටම අදාල ලියවිලි ඇතුලත් විශ්‍රාම වැටුප් ගොනුවක් පවත්වා ගෙන යා යුතුවීම. | ගොනු නොමැති විශ්‍රාමිකයන් සඳහා තොරතුරු ලබා ගෙන විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 13/2001 පරිදි තාවකාලික ගොනු සකස් කර අනුමැතියට එවීමට කටයුතු කරන බව ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් දන්වා ඇත. |
| (ඈ) | මීගමුව ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විශ්‍රාමිකයින් 54 දෙනෙකු සඳහා සකස් කර තිබූ තාවකාලික ගොනු දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර අනුමත කරගෙන නොතිබුණි. තවද, විශ්‍රාම වැටුප් දත්ත පද්ධතිය අනුව ප්‍රාදේශිය ලේකම් කාර්යාල සීමාවෙන් පිටත පදිංචි විශ්‍රාමිකයින් 23 | තාවකාලික ගොනු විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු ඉදිරිපත් කර අනුමත කරවා ගත යුතුවීම. | ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් පිටත විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් තාවකාලිකව නවතා ඇති අතර ගොනු අනුමත කර විධිමත් පරිදි මාරු කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දී ඇත. |

| | | | |
|---|---|---|---|
| | දෙනෙකු මීගමුව ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන් විශ්‍රාම වැටුප් ලබා ගනිමින් තිබුණි. | | |
| (ඉ) | නියැදි පරීක්ෂාවකදී හෙළිදරව් වු පරිදි විශ්‍රාම වැටුප් ගෙවීම් දත්ත පද්ධතියේ ජාතික හැඳුනුම්පත් අංක නොමැතිව මීගමුව, මීරිගම, ගම්පහ, අලව්ව, වරකාපොල, වත්තල යන ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල විශ්‍රාම වැටුප් ගෙවීම් සිදුකරන අවස්ථාවන් 99 ක් පවතින බව නිරීක්ෂණය විය. | වාර්ෂික පදිංචි සහතික ගෙන්වා ගන්නා අවස්ථාවේදී හෝ ජාතික හැඳුනුම්පත් අංක දත්ත පද්ධතියට ඇතුලත් කළ යුතුවීම. | විශ්‍රාමිකයන්ගේ ජාතික හැඳුනම්පත් සකස් කිරීම සඳහා ග්‍රාම නිලධාරින් මගින් කටයුතු කරන බව ප්‍රාදේශීය ලේකම්වරු විසින් දන්වා ඇත. |

**4. මානව සම්පත් කළමනාකරණය**

**---------------------------------**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| විශ්‍රාම වැටුප් නිලධාරින් සහ ලේඛණ සහකාර නිලධාරින් සඳහා වන වාර්ෂික ස්ථාන මාරුවීම් ප්‍රතිපත්තිය ප්‍රකාරව එකම සේවා ස්ථානයක වසර 05 කට වඩා වැඩි කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරින් අනිවාර්යයෙන් ස්ථාන මාරු කල යුතුව තිබුනද දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලයේ සේවයේ යෙදී සිටින නිලධාරින් 8 දෙනෙකු වසර 10 කට වඩා වැඩි සේවා කාලයක්ද, නිලධාරින් 11 දෙනෙකු වසර 6 ත් 10 ත් අතර සේවා කාලයක්ද සේවය කර තිබු නමුත් එම නිලධාරීන් සඳහා ස්ථාන මාරුවීම් ලබාදී නොතිබුණි. | දීර්ඝ කාලයක් ස්ථාන මාරුවීම් නොලබා සිටීමෙන් මූල්‍ය අක්‍රමිකතා සිදු විය හැක. | ස්ථාන මාරු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදී නිලධාරීන්ගේ අවශ්‍යතාවයන් මෙන්ම දෙපාර්තමේන්තුවේ සේවා අවශ්‍යතාවය පිළිබඳ සැළකිල්ලට ගෙන ඇත. විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලිය මධ්‍යගතව ප්‍රධාන කාර්යාලය මඟින් සිදු කරන බැවින් හා විශ්‍රාම වැටුප් විෂය පිළිබඳ පළපුරුදු නිලධාරීන්ගේ සේවය අත්‍යවශ්‍ය බැවින් විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලිය සඳහා විශාල දායකත්වයක් දරන මෙන්ම විශ්වාසය තැබිය හැකි නිලධාරින් සේවා අවශ්‍යතාවය මත අභ්‍යන්තර ස්ථාන මාරු ලබා දී හෝ අංශ ප්‍රධානකම් ලබා දී ප්‍රධාන කාර්යාලයේ රඳවා ගනු ලැබේ.<br>එසේම ආයතනික තත්ත්වයන් තුල විනයානුකූලව ක්‍රියා කිරීමට නියමිත සහ කුමන ක්‍රමයකින් හෝ සේවය අවසන් කිරීමට නියමිත නිලධාරින් ද ස්ථානමාරු කරනු නොලැබේ. |